චක්‍රලේඛ අංක: 14/2003

මගේ අංකය: ප්‍ර.නො.01/19
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක.280, කෙලින් වීදිය,
කොළඹ - 11.
2003.12.10 දින.

සියළුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍ර මත වූ අයිතිය නොතාරිස් ඔප්පු මඟින් අන්‍යයන්ට පැවරීම**

ඉහත සඳහන් කරුණට අදාලව ප්‍රසිද්ධ නොතාරිස්වරුන් විසින් ලියන ලද ප්‍රදාන පත්‍ර පැවරීමේ ඔප්පු ලියාපදිංචිය සඳහා බාර දීමේදී සමහර ඔප්පුවල වටිනාකමක් සඳහන් කර දෙවන පිටපතේ විකුණුම්කරයකට අදාල පරිදි මුද්දර ගාස්තු ගෙවා බාරදෙන බවත්, සමහර ඔප්පුවල වටිනාකමක් සඳහන් නොකර පැවරීමේ ප්‍රකාශන ඔප්පු ලෙසුවෙන් සඳහන් කර මුද්දර ගාස්තුවලින් තොරව බාරදෙන බවත් මා වෙත වාර්තා වී ඇත.

02. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ ඉඩම්ලාභීන්ට දෙනු ලබන ප්‍රදාන පත්‍ර රජයේ අවශ්‍යතාවය මත ඒ පුද්ගලයන්ට දෙනු ලබන බැවින්, එම අවස්ථාවේදී ලියාපදිංචිය සඳහා මුද්දර ගාස්තු අය කිරීමක් සිදු නොකරන අතර, පසුව දීමනාපත්ලාභීන් විසින් සිදු කරනු ලබන බැහැර කිරීම්, පැවරීම්, උගස් කිරීම්, අතුරු බදුදීම් වලදී සින්නක්කර ඉඩම් සඳහා අනුගමනය කරන නීති ප්‍රතිපාදන අදාල කරගත යුතු බව ඉඩම් අමාත්‍යාංශ ලේකම්ගේ අංක. එල්ඩී./4/1/පොදු හා 2003.11.14 දිනැති ලිපියෙන් මා වෙත දන්වා ඇත.

03. එබැවින්, ඒ අනුව කටයුතු කිරීමට පියවර ගන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත්:- 1. සියලුම කලාප බාර නිලධාරීන්. - දැ.ගැ.පි. හා අ.ක.ස.
2. අභ්‍යන්තර විගණන අංශය. - දැ.ගැ.පි.
3. ඉඩම් කොමසාරිස්.

නවී/10.